# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 40 දරන හිදායතුල් ඉස්ලාම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 අගෝස්තු මස 21 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1992 අංක 40 දරන හිදායතුල් ඉස්ලාම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 65/90.

**හිදායතුල් ඉස්ලාම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"හිදායතුල් ඉස්ලාම් සංගමය" නමින් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, ඒ සංගමයේ සාමාජිකයන් විසින් එකඟ වන ලද රීතිවලට අනුකූලව ඒ සංගමයට අදාළ සියලු කටයුතු සාර්ථක ලෙස කරගෙන යාම සහ ඉටු කිරීම සඳහා, මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

ඒ සංගමය පිහිටුවන ලද්දේ කවර පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් ඒ සංගමය විසින් සාර්ථක ලෙස කරගෙන ගොස් සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් ද ඒ ඉල්ලීමට ඉඩදීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1992 අංක 40 දරන හිදායතුල් ඉස්ලාම් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන හිදායතුල් ඉස්ලාම් සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින්නා වූ හෝ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින් මතු ඇතුළත් කරගනු ලබන්නා වූ හෝ තැනැත්තන් සංඛ්‍යාව, මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "හිදායතුල් ඉස්ලාම් සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් බවට පත්වන්නේ ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ භාවිතා කිරීමේත් ස්වකීය කැමැත්ත අනුව එය වෙනස් කිරීමේත් සම්පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාව සතු වන්නේ ය. එකී නාමය යටතේ ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි ය. හිදායතුල් ඉස්ලාම් සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පොදු පරමාර්ථ සඳහා බව මින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) දුප්පත්, අසරණ පවුල්වලින් පෙළෙන සහ අනාථ ළමයින් සඳහා මද්රසා අනුසාරයෙන් කුර්ආන් සහ ආගමික පන්ති නොමිලයේ පැවැත්වීම සහ සුදුසු ළමයින්ට ආගමික පොත් හා පාසැල් පොත් නොමිලයේ සැපයීම ;

(ආ) මුස්ලිම් ජනයා අතර සමගිය පිළිබඳ හැඟීම් නගාලීම සහ ඔවුන් අතර හොඳහිත හා මිත්‍රත්වය වැඩිදියුණු කිරීම ;

(ඇ) ඉස්ලාමික විෂයයන් පිළිබඳ ආගමික පොදු දේශන පැවැත්වීමට සංවිධානය කිරීම ;

(ඈ) මුස්ලිම් ජනයාගේ ආගමික හා අධ්‍යාපනික දියුණුව ඇති කිරීම සඳහාත් මුස්ලිම් ජනයාගේ සමාජයීය හා ආර්ථික අභිවෘද්ධිය සඳහාත් කටයුතු කිරීම ;

(ඉ) ඉස්ලාම් භක්තිය වැළඳගැනීමට අපේක්ෂා කරන තැනැත්තන්ට සහාය දීම ;

(ඊ) මුස්ලිම් ජනයා අතර දෑවැදි ක්‍රමය අශෝබි කිරීම;

(උ) මුස්ලිම් ළමයින්ගේ අධ්‍යාපනය නගාලීම සහ ඔවුන් අතර ආගමික හැඟීම් අභිවර්ධනය කිරීම අරමුණු කොට විවිධ තරඟ පැවැත්වීම සහ ත්‍යාග ප්‍රදානෝත්සව සංවිධානය කිරීම;

(ඌ) මුස්ලිම් ජනයා සහ පොදු ජනයා සඳහා පුස්තකාලයක් සහ කියවීම් ශාලාවක් පවත්වා ගෙන යාම;

(එ) මුස්ලිම් ජනයා සඳහා නිදහස් ඉස්ලාමීක ආගමික පාඨශාලා පිහිටුවීම හා පවත්වා ගෙන යාම;

(ඒ) දෙමාපියන් සහ මද්රසා මුඅල්ලිම් අතර අන්‍යෝන්‍ය සහ යෝගතාව, හොඳහිත සහ මනා අවබෝධය නගාලීම; සහ

(ඔ) ඉහත සඳහන් පරමාර්ථ ඉෂ්ට කර ගැනීම පිණිස අවශ්‍ය හා යෝග්‍ය වෙනත් සියලු පියවර ගැනීම.

පාලක කමිටුව.

4. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද, ඒ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වන පාලක කමිටුවක් විසින්, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව, සංස්ථාවේ කටයුතු පාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී පැවති සංගමයේ පාලක කමිටුව සංස්ථාවේ ප්‍රථම පාලක කමිටුව විය යුතු ය.

(3) සංස්ථාවේ පාලක කමිටුව සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීමේ දී 5 වන වගන්තියේ සඳහන් භාරකාර මණ්ඩලය විමසිය යුතු අතර, එහි ආධාර ලබා ගත යුතු ය.

භාරකාර මණ්ඩලය.

5. (1) සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීති අනුව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද ඒ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තාවූ ද තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ භාරකාර මණ්ඩලයක් විය යුතු ය.

(2) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන භාරකාර මණ්ඩලය විසින් පාලක කමිටුවට දෙනු ලැබිය හැකි ය. ඒ විධාන අනුව ක්‍රියා කිරීම පාලක කමිටුවේ කාර්ය විය යුතු ය.

(3) සංස්ථාවේ පළමුවන භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී ධුර දැරූ සංගමයේ භාරකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ බලතල සහ කාර්ය.

6. (1) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය වන හෝ උපයෝගී වන්නා වූ ද මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීති සහ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද සියලු ම දේ, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව, කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් සංස්ථාව වෙත පැවරුණු බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන බලතල සහ කාර්ය සංස්ථාව සතු වන්නේ ය :—

(අ) දේශීය හෝ විදේශීය මාර්ගවලින්, මුදලින් හෝ අන්‍යාකාර යකින්, ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග, සහනාධාර සහ දායක මුදල් භාරගැනීම සහ එකතු කිරීම ;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් කවර වුවද ආකාරයකින් අත් කර ගැනීම සහ දැරීම, ඒ දේපල බද්දට නැතහොත් කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, ඔඩපනය කිරීම විකිණීම හෝ අන්‍යාකාරයකින් නීයාදනය කිරීම ;

(ඇ) බැංකු ගිණුම් ඇරඹීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ සපයා ගැනීම ;

(ඈ) සංස්ථාව වෙත සතුව ඇති හෝ සංස්ථාවට අයත් හෝ මුදල් ප්‍රමාණවත් සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හෝ සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු නැතහොත් අවශ්‍ය අත්දමේ ඉඩම්, ගොඩනැගිලි, භාණ්ඩ බඩු බාහිරාදිය හෝ වෙනත් දේපළ මිලට ගැනීම හෝ අත් කර ගැනීම සඳහා යෙදවීම ;

(ඉ) සංස්ථාවට අයත් හෝ සංස්ථාව විසින් දරනු ලබන හෝ යම් ඉඩමක, යම් ගොඩනැගිල්ලක් නැතහොත් ඉදිකිරී මක් ගොඩනැංවීම හෝ ගොඩනැංවීමට සැලැස්වීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා සංස්ථාවට උපදෙස් දීම සහ සංස්ථාවට මුදලින් ආධාරදීම සඳහා ආධාරකාර මණ්ඩලයක් තෝරා ගැනීම ;

(උ) පාලක කමිටුවේ සාමාජිකයන් සිව්දෙනකුගෙන් සමන්විත වන ඇතුළත් කිරීමේ මණ්ඩලයක් මද්රාසයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා පත් කිරීම සහ ඒ ඇතුළත් කිරීමේ මණ්ඩලයේ සාමාජිකයකු මද්රාසයේ කළමනාකරු ලෙස පත් කිරීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන නිල ධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙන් නෙරපීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම.

සංස්ථාවේ රීති.

7. (1) සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ අස්වීම හෝ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම සඳහා ද, පාලක කමිටුවේ, ආධාරකාර මණ්ඩලයේ, ඇතුළත් කිරීමේ මණ්ඩලයේ, භාරකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේත් කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද, සංස්ථාවේ කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සඳහා සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා ද අවශ්‍ය වන්නා වූද මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද රීති, සංස්ථාවේ සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී, බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කළ සෑදීම නීත්‍යානුකූල වන අතර, එසේ සාදනු ලැබූ රීති, (2) වන උපවගන්තියේ සඳහන් නියමයන්ට යටත්ව, එවැනිම, රැස්වීමක දී එවැනිම ආකාරයෙන් වෙනස් කිරීම, ඒවාට අලුතින් එකතු කිරීම හෝ ඒවා සංශෝධනය කිරීම නැතහොත් ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(2) තත්කාලයේ සංස්ථාවේ බලපවත්නා රීති හෝ මින් මතු සම්මත කරගනු ලබන රීති හෝ කිසිවක්, සංස්ථාවේ මහා සභා රැස්වීමකදී, ඊට පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක බහුතර ඡන්දයකින් මිස වෙනස් කිරීම හෝ ඊට එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම නොකළ යුතු ය :

එසේ වුවද එවැනි වෙනස් කිරීමක්, එකතු කිරීමක්, සංශෝධනයක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් පාලක කමිටුව විසින් කලින් අනුමත කරනු ලැබ තිබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ බලපැවැත් වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංගමයට ලැබිය යුතු සහ සංගමය විසින් ගෙවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සංගමයේ පැවති ණය සහ බැරකම් සියල්ල මෙයින් සංස්ථාපිත සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට ලැබිය යුතු සියලු ණය සහ සංගමය වෙත ගෙවිය යුතු සියලු දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ ඇරිය හැකි බව.

9. යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතුවන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළ භාරගෙන තබා ගැනීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් තබාගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව පාවිච්චි කළ යුතු ආකාරය.

**10.** පාලක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරියේ දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් ඉදිරියේ දී මුද්‍රාව තැබූ බවට සාක්ෂි වශයෙන් ඒ සාමාජිකයන් දෙදෙනා විසින් එවැනි සාධන පත්‍රයකට තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් ඒ සාධන පත්‍රයට අත්සන් තබන යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන් හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සියලු පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. කොළඹ 7, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.